සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

පාලි I
பாளி I
Pali I

74 S-T-E I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** නිකාය ග්‍රන්ථ හැඳින්වීමට භාවිත අපර නාමයක් වන්නේ මේවායින් කවරක් ද?
(1) පාළි (2) පිටක (3) සඟි (4) සුත්ත

**2.** දෙවන සංගායනාවට සහභාගී වූ මහරහතන් වහන්සේලා සංඛ්‍යාව,
(1) තුන්සීයකි. (2) පන්සීයකි. (3) හත්සීයකි. (4) දහසකි.

**3.** කුසාවතී නගරයේ සෞභාග්‍යය පිළිබඳ සඳහන් වන සූත්‍රය තෝරන්න.
(1) මහානිදාන (2) මහාපරිනිබ්බාන
(3) මහාසමය (4) මහාසුදස්සන

**4.** ශරීරය තුඹසකට උපමා කොට දෙසූ සූත්‍රයකි.
(1) අලගද්දූපම (2) කකචූපම (3) රථවිනීත (4) වම්මික

**5.** ශ්‍රාවක භාෂිතයක් ලෙස සැලකෙන සූත්‍රය අන්තර්ගත වරණය තෝරන්න.
(1) චුල්ලහත්ථිපදොපම (2) බ්‍රහ්මජාල
(3) සතිපට්ඨාන (4) සංගීති

**6.** **"න තං ද්වංගුලපඤ්ඤාය, සක්කා පප්පොතුමිත්ථියා"** මෙම ප්‍රකාශය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?
(1) බුදුරදුන් විසින් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන්ට
(2) මහාප්‍රජාපතී ගෝතමිය විසින් බුදුරදුන්ට
(3) මාරයා විසින් සෝමා තෙරණියට
(4) සල්ලාලයෙකු විසින් සුභාජීවකම්බවනිකා තෙරණියට

**7.** උභතො විභංගයට අපර නාමයක් වන්නේ මේවායින් කවරක් ද?
(1) ඛන්ධක (2) භික්ඛුවිභංග (3) විභංගප්පකරණ (4) සුත්තවිභංග

**8.** පහත ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) පාරාජිකා හතරකි. එයින් එකක් හෝ කඩ කළහොත් භික්ෂුභාවය නැති වේ.
(2) සංඝාදිසේස දහතුනකි. අබ්භාන කර්මයෙන් පිරිසිදු විය හැකි ය.
(3) නිස්සග්ගිය පාචිත්තිය තිහකි. ඇවැත් දෙසා පිරිසිදු විය හැකි ය.
(4) සේඛියා හැත්තෑවකි. ඒවා කඩ කිරීමෙන් දුක්කට නම් ඇවතක් වේ.

**9.** ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව ගැටපදයක් වන්නේ පහත දැක්වෙන කවර කෘතියට ද?
(1) කාම්බොජ මහාවංස (2) ඡකෙසධාතුවංස
(3) ධම්මපදට්ඨකථා (4) මහාබොධිවංස

**10.** අභිධර්ම අටුවාවක් වන්නේ මේවායින් කවර ග්‍රන්ථය ද?
(1) අත්ථසාලිනී (2) ධම්මසංගණී
(3) පපංචසූදනී (4) සමන්තපාසාදිකා

**11.** **'කරං'** යන්නෙහි ධාතු ප්‍රකෘතිය මේවායින් කුමක් ද?
(1) කර (2) කරොන්ත
(3) කරොන්තු (4) කරොන්තා

**12.** **'තීරමෙවානුධාවති'** යන්නෙහි නිවැරදි විසන්ධි කිරීම ඇතුළත් වරණය තෝරන්න.
(1) තීරමෙව + අනුධාවති (2) තීරං + එවානුධාවති
(3) තීරං + එවං + අනුධාවති (4) තීරං + එව + අනුධාවති

**13.** **'භයගජරථාමලකා'** යනු,
(1) කම්මධාරය සමාස පදයකි. (2) තප්පුරිස සමාස පදයකි.
(3) ද්වන්ද සමාස පදයකි. (4) බහුබ්බීහි සමාස පදයකි.

**14.** **මග්ගසිර** (මාගසිර) **මාස** යන්නෙන් අදහස් වන්නේ කවර මාසය ද?
(1) ඇසළ (2) නිකිණි (3) බිනර (4) උඳුවප්

**15.** **'ඡාතසිගාලී'** යන්නෙහි තේරුම කුමක් ද?
(1) අලුත උපන් සිවළිය (2) බඩගින්නෙන් පෙළුණු සිවළිය
(3) මහළු සිවළිය (4) සැඟවුණු සිවළිය

**16.** **'පාරතො'** යන්නෙහි විරුද්ධාර්ථවත් පදය ඇතුළත් වරණය කුමක් ද?
(1) ඔරතො (2) කාලතො (3) පුරතො (4) භොගතො

**17.** පාලි භාෂාවෙන් **'උපාහනා'** යනු,
(1) ජනෙල් ය. (2) දැහැටි ය. (3) පාවහන් ය. (4) හිස්වැසුම් ය.

**18.** **'අභිසිඤ්චිංසු'** යන ක්‍රියාපදය සම්බන්ධයෙන් නිවැරදි ව්‍යාකරණ විභාග සහිත වරණය තෝරන්න.
(1) අජ්ජතනී, පඨමපුරිස, බහුවචන පදයකි.
(2) භවිස්සන්ති, උත්තමපුරිස, බහුවචන පදයකි.
(3) වත්තමානා, පඨමපුරිස, බහුවචන පදයකි.
(4) සත්තමී, මජ්ඣිමපුරිස, ඒකවචන පදයකි.

**19.** උපසර්ග **දෙකක්** සහිත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අපාපුණිං, අභිසිඤ්චිංසු, විචින්තයී (2) පතිට්ඨහිස්සති, පසීදති, අනුධාවති
(3) පරියොදපෙය්‍ය, උපාදාය, ආරුහිං (4) සුදුත්තරං, පරිනිබ්බුතා, උපනික්ඛිපිතබ්බං

**20.** එකම ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් පද සහිත වරණය මේවායින් කවරක් ද?
(1) ආගම්ම, අඤ්ඤාය, සුත්වාන (2) උපාදාය, උට්ඨාය, උසභො
(3) ගතො, තතො, පතිතො (4) සචෙ, යන්නූන, විදූනං

- පහත පාඨය කියවා පාලියෙන් අසා ඇති **21** සිට **23** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

" අථ ඛො මල්ලිකාදෙවී තං කාරණං ඤත්වා රාජානං උපසංකමිත්වා පුච්ඡි. කින්නු ඛො මහාරාජ, බ්‍රාහ්මණා පුනප්පුනං සංසරන්තීති? සුඛිතා ත්වං අම්හාකං කණ්ණමූලෙ ආසිවිසං චරන්තං න ජානාසී'ති."

**21.** මල්ලිකාදෙවී කිං අකාසි?
(1) සා ආසිවිසං පස්සි. (2) සා සුඛිතා ත්වන්ති ආහ.
(3) සා පඤ්හං පුච්ඡි. (4) සා බ්‍රාහ්මණෙ න ජානාසි.

**22.** කෙ තත්ථ ඉතොචිතො චරිංසු?
(1) ආසිවිසා (2) දෙවියො (3) බ්‍රාහ්මණා (4) රාජානො

**23.** සංසරන්තී'ති කිං?
(1) ආහිණ්ඩන්ති (2) පුච්ඡන්ති (3) වදන්ති (4) සංවසන්ති

**24.** මහාසුපින ජාතකයෙහි ඇතුළත් සිහින සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශයක් වන්නේ,
(1) දෙන්නු එදින උපන් වස්සන්ගේ කිරි බොනු දැකීමයි.
(2) දෙපස මුව ඇති අශ්වයෙකු මුව දෙකින්ම තණකොළ කනු දැකීමයි.
(3) රජුගේ කන ලඟ නාගයෙකු සිටිනු දැකීමයි.
(4) හිස් ලබු කබල් දියෙහි ගිලී යනු දැකීමයි.

**25.** මහාසුපින ජාතකයේ අතීත කථා වස්තුවෙහි සඳහන් **රජතුමා, මානවයා** හා **තාපසයා** වන්නේ වර්තමාන කථාවට අනුව පිළිවෙළින්
(1) ආනන්ද තෙරුන්, සැරියුත් තෙරුන් හා බුදුරදුන් ය.
(2) බුදුරදුන්, සැරියුත් තෙරුන් හා ආනන්ද තෙරුන් ය.
(3) සැරියුත් තෙරුන්, ආනන්ද තෙරුන් හා බුදුරදුන් ය.
(4) සැරියුත් තෙරුන්, බුදුරදුන් හා ආනන්ද තෙරුන් ය.

**26.** ධම්මපදයට අයත් **නො වන** වග්ගය දැක්වෙන වරණය තෝරන්න.
(1) අරහන්තවග්ග (2) බුද්ධවග්ග
(3) භික්ඛුවග්ග (4) මාරවග්ග

**27.** '**සෙලො යථා එකඝනො**' යන ගාථාවෙහි අවසාන පාදය සඳහන් වරණය තෝරන්න.
(1) චිත්තක්ලෙසෙහි පණ්ඩිතො. (2) න සමිඤ්ජන්ති පණ්ඩිතා.
(3) විප්පසීදන්ති පණ්ඩිතා. (4) සදා රමති පණ්ඩිතො.

**28.** ධම්මපදයේ පණ්ඩිත වග්ගය තුළ ප්‍රධාන වශයෙන්
(1) අටලෝ දහමෙහි අකම්පාව සිටීමේ පිළිවෙත ඉගැන්වේ.
(2) නැණවත් පුද්ගලයන්ගේ දෛනික චර්යාව පැහැදිලි කෙරේ.
(3) කාමයන්හි ආදීනව පිළිබඳව සඳහන් වේ.
(4) යහපත් පුද්ගලයන් ඇසුරු කිරීමෙහි ආනිසංස ඉගැන්වේ.

**29.** ''තෙ ජනා පාරමෙස්සන්ති - **මච්චුධෙය්‍යං** සුදුත්තරං'' යන පාඨයේ තද කළු අකුරෙන් මුද්‍රිත පදයේ ධර්මමය විවරණයට අදාළ වන්නේ,
(1) කාමච්ඡන්ද, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි වේ. (2) කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා වේ.
(3) කාමලොක, රූපලොක, අරූපලොක වේ. (4) කිලෙසමාර, දෙවපුත්තමාර, මාරමාර වේ.

**30.** සිගාලක සූත්‍රය දේශනා කළ අවස්ථාවේ බුදුරදුන් වැඩ සිටි නගරය වන්නේ,
(1) කොසඹෑනුවරයි. (2) පාවානුවරයි. (3) රජගහනුවරයි. (4) සැවැත්නුවරයි.

**31.** සුරාමෙරයෙහි ආදීනව සයෙන් එකක් ලෙස සිගාලක සූත්‍රයෙහි සඳහන් **නො වන්නේ** මෙවායින් කුමක් ද?
(1) කලහප්පවඩ්ඪනී (2) රොගානං ආයතනං
(3) ආලස්සානුයොගො (4) සන්දිට්ඨිකා ධනජානි

**32.** සුහද මිත්‍රයෙකු වන්නේ මොවුන්ගෙන් කවරෙක් ද?
(1) අත්ථක්ඛායී (2) අඤ්ඤදත්ථුහර
(3) අනුප්පියභාණී (4) වචීපරම

**33.** **"මිත්තාමච්චා ච .................... දාසකම්මකරා ...................."** මෙහි හිස්තැන්වලට අදාළ නිවැරදි පද යුගලය සිගාලෝවාද සූත්‍රයට අනුව තෝරන්න.
(1) උත්තරා, හෙට්ඨා (2) පච්ඡා, උත්තරා
(3) පුබ්බා, දක්ඛිණා (4) හෙට්ඨා, උද්ධං

**34.** '**ආරකා**' යන්න,
(1) ක්‍රියාවකි. (2) තද්ධිතයකි. (3) නාමයකි. (4) නිපාතයකි.

**35.** **'සම්මියසම්මියො'** යන්නෙන් අදහස් වන්නේ,
(1) යමක් පිළිබඳව මනාව පිළිපදින්නා ය.
(2) නිසි වේලාවට පැමිණෙන්නා ය.
(3) සියල්ලන්ගේ එකඟත්වයෙන් සම්මත කරන්නා ය.
(4) හමු වූ තැනකදී පමණක් මිතුරු බව හඟවන්නා ය.

**36.** **'උපජ්ඣායො .................. පුච්ඡිතබ්බො'** මෙහි හිස්තැනට ව්‍යාකරණානුකූලව ගැළපෙන පදය තෝරන්න.
(1) පානීයො (2) පානීයං (3) පානීයෙන (4) පානීයස්ස

**37.** විහාරයකට අයත් **නො වන** අංගයක් වන්නේ මේවායින් කුමක් ද?
(1) අග්ගිසාලා (2) උපට්ඨානසාලා
(3) යඤ්ඤාවාට (4) වච්චකුටි

**38.** විනය කර්මයක් ප්‍රකාශ **නො වන** වරණය කුමක් ද?
(1) ඨපනීය (2) තජ්ජනීය (3) පබ්බාජනීය (4) පටිසාරණීය

**39.** විනයෙහි පෙන්වාදෙන පරිදි මකුළුදැල් ඉවත් කළයුතු නිවැරදි පිළිවෙත වන්නේ,
(1) උඩ සිට පහළට ය. (2) පහළ සිට උඩට ය.
(3) දෙපසට ය. (4) මැද සිට උඩට සහ පහළට ය.

**40.** සද්ධිවිහාරික භික්ෂුවට පාසිවුරු ආදිය නොමැති කල්හි උපාධ්‍යායයන් වහන්සේ විසින් කළයුතු වන්නේ
(1) තමා විසින් ඒවා සපයා දීම ය.
(2) තමාගේ පාසිවුරු සද්ධිවිහාරික භික්ෂුවට දීම ය.
(3) අනෙකෙකුගෙන් ඉල්ලා ගැනීමට උපදෙස් දීම ය.
(4) ඔහු විසින් ම සපයා ගැනීම සඳහා උත්සුක කිරීම ය.

**41.** **"මුත්තා සමුද්දා උග්ගන්ත්වා, තීරෙ වට්ටි වියට්ඨිතා"** මෙම උද්ධෘතය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර සහිත වරණය තෝරන්න.
(1) අනුප්‍රාසයෙන් හා උපමාවකින් යුක්ත ය.
(2) අනුප්‍රාසයෙන් හා සංකේතයකින් යුක්ත ය.
(3) උපමාවකින් හා රූපකයකින් යුක්ත ය.
(4) රූපකයකින් හා සංකේතයකින් යුක්ත ය.

**42.** පහත ප්‍රකාශ සලකන්න.
**A** - 'මුටසීව රජුට පුත්තු දස දෙනෙක් ද දූවරු දෙදෙනෙක් ද වූහ.'
**B** - 'මුටසීව රජුගේ තෙවැනි පුත්‍රයා දෙවනපෑතිස් ය.'
මෙම ප්‍රකාශ දෙක අතුරෙන්,
(1) **A** සහ **B** සත්‍ය වේ.
(2) **A** සත්‍ය අතර **B** අසත්‍ය වේ.
(3) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(4) **A** සහ **B** අසත්‍ය වේ.

**43.** දෙවනපෑතිස් රජු දෙවන වරට අභිෂේක ලද්දේ,
(1) ඇසළ මස පොහෝ දිනක ය. (2) උඳුවප් මස පොහෝ දිනක ය.
(3) මැදින් මස පොහෝ දිනක ය. (4) වෙසක් මස පොහෝ දිනක ය.

**44.** මහාවංසයෙහි එකොළොස්වන පරිච්ඡේදයෙන් වඩාත් ප්‍රකට වනුයේ පහත කරුණුවලින් කවරක් ද?
(1) අතීත ශ්‍රී විභූතිය
(2) දෙවනපෑතිස් රජුගේ රාජ්‍යාභිෂේකය
(3) ධර්මාශෝක රාජ චරිතයේ උත්කර්ෂවත් බව
(4) මුටසීව රජුගේ ශාසනික සේවාව

**45.** මහාවංසයේ සඳහන් **නො වන** කරුණක් සහිත වරණය තෝරන්න.

(1) අශෝක රජු 'මෙවැනි මැණික් මට නැත' යි අතිශයින් සතුටට පත්විය.
(2) තාම්‍රලිප්තයෙන් නැව් නැගි දූතයෝ දඹකොළ පටුනෙන් ලක්දිවට ගොඩ බටහ.
(3) දඹදිව ගිය දූතයෝ රජුට පඬුරු දී දින සතකින් ආපසු ලක්දිවට පැමිණියහ.
(4) දෙවනපෑතිස් රජතුමා අරිට්ඨ ඇමතියා ප්‍රමුඛ දූතයන් සිවු දෙනෙකු අශෝක රජු වෙත යැවීය.

**46.** **මහාමෙඝවන** උද්‍යානය එනම් වූයේ,

(1) උයන් බිම පූජාකරන දිනයෙහි අහස ගිගුරුම් දුන් නිසා ය.
(2) උයන් බිම සකසන දිනයේ අකාල මේඝයක් නැඟී මහවැසි වැටුණු නිසා ය.
(3) එම භූමිභාගය මහාමේඝ නම් බ්‍රාහ්මණයෙකු සතුව පැවති නිසා ය.
(4) මහා මේඝයක් මෙන් සිය දහස් ගණන් තුරු ගොමු තිබූ නිසා ය.

**47.** **මොලිං, වටංසං, පාමංගං, හිඞ්කාරං** යන පද සතරට වඩාත් ගැළපෙන තේරුම පිළිවෙළින්,

(1) ඔටුන්න, කන් පළඳනාව, හවඩිය, කෙණ්ඩිය වේ.
(2) ඔටුන්න, කර්ණාභරණ, කඩුව, කෙණ්ඩිය වේ.
(3) වල්විදුනාව, නළල්පටය, කඩුව, ඡත්‍රය වේ.
(4) වල්විදුනාව, ඔටුන්න, හවඩිය, කන් පළඳනාව වේ.

**48.** වක්කලී ථෙරාපදානය අයත් වන්නේ අපදානපාළියෙහි

(1) මහාකච්චානවග්ගයට ය.
(2) තිණදායකවග්ගයට ය.
(3) ඵලදායකවග්ගයට ය.
(4) භද්දියවග්ගයට ය.

**49.** වක්කලී තෙරණුවන් සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශයක් වන්නේ මේවායින් කුමක් ද?

(1) අවසන් අත් බැව්හි තව්තිසාවෙන් චුතව සැවැත්නුවර උපන්නේ ය.
(2) ගෞතම බුද්ධශාසනයෙහි ශ්‍රද්ධාධිමුක්ත ශ්‍රාවකයින් අතර අගතැන් ලැබී ය.
(3) ළදරු කාලයේ සියුමැලි ඔහු පිශාචියක විසින් බිය ගන්වන ලදී.
(4) ශාසනයෙහි පැවිදි වූ මුල් අවධියෙහිම රහත් බවට පත්විය.

**50.** **අජ්ජතනී, පඤ්චමී, සත්තමී** ආඛ්‍යාත රූප පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

(1) ආහරි, භවෙ, කරොතු
(2) ලභෙය්‍ය, ගච්ඡතු, ඔවදි
(3) අදාසි, හොන්තු, භජෙ
(4) කරොසි, විචින්තයී, ඉච්ඡෙය්‍ය

* * *